## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
## විශ්වවිද්‍යාල ප්‍රවේශය - 2024/2025 අධ්‍යයන වර්ෂය
## www.ugc.ac.lk

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගැනීම පිණිස, **2024 වර්ෂය සඳහා පවත්වන ලද අ. පො.ස (උසස් පෙළ) විභාගයේදී** විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ගෙන්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අයදුම්පත් කැඳවනු ලැබේ. විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් වෙත ඒ බව දැනටමත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් දැනුම් දී ඇත.

**විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා <u>අන්තර්ජාලය ඔස්සේ අයදුම්පත් යොමු කිරීම අනිවාර්ය අවශ්‍යතාවයක්</u> බව අයදුම්කරුවන්ට දන්වා සිටිනු ලැබේ.**

<u>විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම්</u>

විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇති බවට නිවේදනය කර ඇති, පහත සඳහන් සුදුසුකම් සපුරාලූ අපේක්ෂකයන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

(අ) අවස්ථා තුනකට නොවැඩි වාර ගණනක් තුළ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී එක් වරකදී අනුමත විෂයයන් තුනටම අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබීම.

(ආ) සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයෙන් 30% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබා තිබීම.

සටහන **1:** **සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයට 30% ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගැනීමට අපොහොසත් වූ අපේක්ෂකයන්, ඉසෙඩ් අගය අනුව ඔවුන් යම්කිසි විශ්වවිද්‍යාලයක පාඨමාලාවකට මෙම අධ්‍යයන වර්ෂයේදී තේරී පත් වුවහොත් එම තේරී පත් වූ පාඨමාලාවේ ලියාපදිංචිවීම සඳහා සුදුසුකම් නොලබයි.**

**එවැනි අපේක්ෂකයෙකු සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයට 30%කට නොඅඩු ලකුණු ප්‍රමාණයක්, විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලැබීම සඳහා වූ අනුමත අවස්ථා තුනට යටත්ව පෙර අවස්ථාවකදී සපුරා ඇත්නම්, එම අපේක්ෂකයා දැනට තේරී සිටින පාඨමාලාව අදාළ විශ්වවිද්‍යාලයේ හැදෑරීම සඳහා ලියාපදිංචිවීමට සුදුසුකම් ලබයි.**

**සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයට 30%කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබාගැනීමට අපොහොසත් වූ අපේක්ෂකයන්, විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලැබීම සඳහා වූ අනුමත අවස්ථා තුනට යටත්ව ඉදිරි වර්ෂයකදී ඒ සඳහා පෙනී සිට එය සමත් වුවහොත්, ඉසෙඩ් අගය අනුව දැනට තේරී සිටින පාඨමාලාව ඉදිරි අධ්‍යයන වර්ෂයකදී අදාළ විශ්වවිද්‍යාලයේ හැදෑරීම සඳහා ලියාපදිංචිවීමට සුදුසුකම් ලබයි.**

<u>2024/2025 අධ්‍යයන වර්ෂයට අදාළ විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත ලබා ගන්නා ආකාරය :</u>

2024/2025 අධ්‍යයන වර්ෂයට අදාළ විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත පහත දක්වා ඇති ඕනෑම ආකාරයකින්, එක් පොතක් සඳහා රු. 1000/= ක මුදලක් ගෙවා ලබා ගත හැකිය.

(අ) අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07 යන ස්ථානයේ පිහිටි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන්.

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ප්‍රවේශ අත්පොත් අලෙවි කිරීම සඳහා පත්කර ඇති බෙදාහැරීමේ නියෝජිතයන් වෙතින් (එම නියෝජිතයින්ගේ ලැයිස්තුව පහතින් දක්වා ඇත).

(ඇ) තැපැල් මඟින් ද විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත් ලබා ගත හැකිය.

ඒ සඳහා ලංකා බැංකුවේ ටොරින්ටන් ශාඛාවේ ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා රැස් කිරීමේ ගිණුම් අංක 0002323287 ට හෝ මහජන බැංකුවේ පුරහල ශාඛාවේ රැස් කිරීමේ ගිණුම් අංක 167-1-001-4-3169407ට බැර වන සේ, ලංකා බැංකුවේ හෝ මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට එක් ප්‍රවේශ අත්පොතක් වෙනුවෙන් රු. 1000/= ක් බැගින් ගෙවා ලබා ගත් කුවිතාන්සියක්, ප්‍රවේශ අත්පොත ලබා ගැනීම සඳහා කරන ලිඛිත ඉල්ලීම සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත එවිය යුතුය. තව ද, නියමිත මුදල් ගෙවූ බවට බැංකු ශාඛාවේ මුද්‍රාව තබා බලයලත් නිලධාරියකු විසින් එම බැංකු කුවිතාන්සිය අත්සන් කර තිබිය යුතුය.

එසේ බැංකු කුවිතාන්සියක් එවා ප්‍රවේශ අත්පොත් තැපැල් මඟින් ලබා ගැනීමේදී, අයදුම්කරුගේ නම හා අවශ්‍ය ප්‍රවේශ අත්පොතේ මාධ්‍යය සඳහන් කර තමාගේ ලිපිනය ලියන ලද මුද්දර නොගැසූ 37 cm x 26 cm ප්‍රමාණයේ ලියුම් කවරයක් සමඟ ලිඛිත ඉල්ලීමක් අයදුම්කරුවන් විසින් නියෝජ්‍ය ලේකම්/විශ්වවිද්‍යාල ප්‍රවේශ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07 යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුය.

<u>අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත් යොමු කිරීම</u>

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.ugc.ac.lk ට පිවිස අන්තර්ජාලය ඔස්සේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්පත් යොමු කිරීම අනිවාර්යය අවශ්‍යතාවක් වේ.**

සටහන 2 : **ප්‍රවේශය සඳහා අයදුම් කිරීමේ පිළිවෙළ උදෙසා 2024/2025 අධ්‍යයන වර්ෂයට අදාළ විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි 4 වන කොටස කියවන මෙන් අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.**

සටහන 3 : **අන්තර්ජාල සේවාව හරහා අයදුම්පත් යොමු කිරීමට අවශ්‍ය උපදෙස් 2024/2025 අධ්‍යයන වර්ෂයට අදාළ ප්‍රවේශ අත්පොතෙහි 5 වන කොටසෙහි දක්වා ඇත.**

සටහන 4 : **විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්කිරීමට අන්තර්ජාල පහසුකම් නොමැති අයදුම්කරුවන්ට දිවයින පුරා පිහිටි ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශීය සහ අධ්‍යයන මධ්‍යස්ථානවලදී (OUSL R&SC), අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති තොරතුරු තාක්ෂණ හා දුරස්ථ අධ්‍යාපන කේන්ද්‍රස්ථානවලදී (ITDLH) ඒවා විවෘත කර තබන වේලාවන්හිදී අන්තර්ජාලය හරහා තම විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත යොමු කිරීමට අවශ්‍ය පහසුකම් නොමිලේ සළසා දී ඇත. මෙම මධ්‍යස්ථානවල ලිපිනයන් සහ දුරකතන අංකයන් 2024/2025 අධ්‍යයන වර්ෂය සඳහා වූ ප්‍රවේශ අත්පොතේ 5වන කොටස අවසානයෙහි දක්වා ඇත.**

සටහන 5 : **විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමේදී අයදුම්කරුගේ වලංගු ජාතික හැඳුනුම්පත අනිවාර්යය වේ.**

සටහන 6 : **අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත පිරවීමේදී යම් ගැටලුවක් ඇති වුවහොත් රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය (1919) හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තොරතුරු මධ්‍යස්ථානයේ දුරකතන අංක 011 – 2695301, 011 – 2695302, අමතා උපදෙස් ලබාගත හැකිය.**

<u>අයදුම්පත් කැඳවීම ආරම්භ කරන දිනය :</u>

2024/2025 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අන්තර්ජාලය ඔස්සේ අයදුම්පත් යොමු කිරීමට අයදුම්කරුවන් හට **<u>2025.05.09</u>** වැනි දින සිට අවස්ථාව සැලසේ.

<u>අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය :</u>

<u>අයදුම්පත්‍ර භාරගැනීමේ අවසාන දිනය **2025.05.30** වැනි දින වේ.</u> **2025.05.30** දිනට පසුව ලැබෙන අයදුම්පත් භාර නොගන්නා බව අයදුම්කරුවන්ට මෙයින් දන්වා සිටිනු ලැබේ.

අන්තර්ජාලය මඟින් අයදුම්පත යොමු කිරීමෙන් පසුව ලැබෙන මුද්‍රිත අයදුම්පත විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි දැක්වෙන උපදෙස් පරිදි අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් අනතුරුව **නියෝජ්‍ය ලේකම්/විශ්වවිද්‍යාල ප්‍රවේශ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**ඒ සඳහා A4 ප්‍රමාණයේ ලියුම් කවරයක් පමණක් භාවිතා කළ යුතුය.**

මුද්‍රිත අන්තර්ජාල අයදුම්පත් භාරදීම ලියාපදිංචි තැපෑලෙන් පමණක් විය යුතු අතර අයදුම්කරුවන්ට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට පැමිණ අයදුම්පත් භාරදිය නොහැකිය.

**<u>විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් නොලැබීම</u>**

2024/2025 අධ්‍යයන වර්ෂයට අදාළ විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි 1.7 ඡේදයට අනුව පහත සඳහන් කාණ්ඩවලට අයත් සිසුන් අභ්‍යන්තර ශිෂ්‍යයන් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රජයේ විශ්වවිද්‍යාලයකට හෝ උසස් අධ්‍යාපන ආයතනයකට ප්‍රවේශය ලැබීම සඳහා සුදුසුකම් නොලබයි.

1. අ.පො.ස. (උසස් පෙළ) විභාගයට තුන් වතාවකට වැඩි වාර ගණනක් පෙනී සිටි සිසුන්.

2. 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත (වරින් වර සංශෝධිත) යටතේ ස්ථාපිත කරන ලද රජයේ විශ්වවිද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීම සඳහා අභ්‍යන්තර සිසුන් වශයෙන් ලියාපදිංචි වී සිටි/සිටින සිසුන්. [මෙම ඡේදය යටතට අදාළ වන රජයේ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන 2024/2025 අධ්‍යයන වර්ෂයට අදාළ විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි 1.6 (8) ඡේදයෙහි සහ 1.6 (10) ඡේදයෙහි දක්වා ඇත ].

3. 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත (වරින්වර සංශෝධිත) යටතේ නොවන වෙනත් පාර්ලිමේන්තු පනතක් යටතේ ස්ථාපිත කරන ලද විශ්වවිද්‍යාලයක/ආයතනයක ප්‍රථම උපාධි පාඨමාලා හැදෑරීම සඳහා නිදහස් අධ්‍යාපන අවස්ථාවක් යටතේ අභ්‍යන්තර සිසුන් ලෙස ලියාපදිංචි වී සිටි/ සිටින සිසුන්. ඒවා නම් ;
    i. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
    ii. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
    iii. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (නම්ගත කර ඇති කැඩෙට් නිලධාරීන් ලෙස - As Enlisted Officer Cadets )
    iv. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය
    v. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය (2017 වසරේ සහ ඊට පසු වසරවලදී ලියාපදිංචි වූ සිසුන්)

4. අධ්‍යාපන විද්‍යා පීඨයක (College of Education) අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීම සඳහා අභ්‍යන්තර ශිෂ්‍යයෙකු වශයෙන් ලියාපදිංචි වී සිටි/සිටින සිසුන්.

5. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය යටතේ ස්ථාපිත කරන ලද විශ්වවිද්‍යාල විද්‍යායතනයක් (University College) මඟින් පවත්වනු ලබන තුන් (03) අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරීම සඳහා නිදහස් අධ්‍යාපන අවස්ථාවක් යටතේ අභ්‍යන්තර සිසුන් ලෙස ලියාපදිංචි වී සිටි/සිටින සිසුන්.

6. පහත **"වැදගත්"** යටතේ සඳහන් කර ඇති ඡේදයන්හි දක්වා ඇති විධිවිධානවලට යටත්ව පහත සඳහන් ආයතනයන්හි තුන් (03) අවුරුදු හෝ ඊට වැඩි කාලයක් සහිත පහත දක්වා ඇති පාඨමාලාවක් පූර්ණකාලීනව හැදෑරීම සඳහා ලියාපදිංචි වී සිටි/සිටින සිසුන්.

    (අ) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) යටතේ පවත්නා ආයතනයක් මඟින් පවත්වනු ලබන උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලාව.

    (ආ) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) යටතේ ඇති ඉංජිනේරු තාක්ෂණ ආයතනය (IET) මඟින් පවත්වන ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමා (NDES) පාඨමාලාව.

    **වැදගත් :**

    කෙසේ වෙතත්, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) යටතේ පවත්නා ආයතනයක් මඟින් පවත්වනු ලබන තුන් (03) අවුරුදු හෝ ඊට වැඩි කාලයක උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලාවක් පූර්ණකාලීනව හැදෑරීම සඳහා ලියාපදිංචි වී සිටින සිසුන් සහ/හෝ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) යටතේ ඇති ඉංජිනේරු තාක්ෂණ ආයතනය (IET) මඟින් පවත්වන ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමා (NDES) පාඨමාලාව පූර්ණකාලීනව හැදෑරීම සඳහා ලියාපදිංචි වී සිටින සිසුන්, ලියාපදිංචිවීම සඳහා අදාළ ආයතනය විසින් ලබා දී ඇති අවසාන දින සිට දින 60 ක කාලයක් ඇතුළත එම ලියාපදිංචිය අවලංගු කර ගතහොත් පමණක්, එසේ ලියාපදිංචි වීමට පදනම් වූ ප්‍රතිඵල ලබා ගත් අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පසුව පැවැත්වූ අ.පො.ස. (උසස් පෙළ) විභාගයක ප්‍රතිඵල මත 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත (වරින් වර සංශෝධිත) යටතේ පිහිටුවා ඇති විශ්වවිද්‍යාලයක/උසස් අධ්‍යාපන ආයතනයක යම් අධ්‍යයන පාඨමාලාවක් සඳහා ප්‍රවේශය ලැබීමට අයදුම් කිරීමට සුදුසුකම් ලැබිය හැකිය.

    ලියාපදිංචිවීම සඳහා අදාළ ආයතනය විසින් ලබා දී ඇති අවසාන දින සිට දින 60 ක කාලයක් ඇතුළත ඉහත 6 ඡේදයෙහි සඳහන් කරන ලද පාඨමාලාවක ලියාපදිංචිය අවලංගු කර නොගත් කිසියම් අපේක්ෂකයෙකු ඉහත 6 ඡේදයට අයත් වන බැවින් එසේ ලියාපදිංචිවීමට පදනම් වූ ප්‍රථිඵල ලබා ගත් අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පසුව පැවැත්වූ අ.පො.ස. (උසස් පෙළ) විභාගයක ප්‍රතිඵල මත, 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත (වරින් වර සංශෝධිත) යටතේ ස්ථාපිත කරන ලද රජයේ විශ්වවිද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රථම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය ලැබීමට සුදුසුකම් නොලබයි.

ඉහත දක්වන ලද දින 60 ක් ඇතුළත ලියාපදිංචිය අවලංගු කරගෙන නැවත විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කළ හැකි වීමේ සහනය, ඉහත 6 ඡේදයෙහි සඳහන්, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) යටතේ පවත්නා ආයතනයක් මඟින් පවත්වනු ලබන උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලාවක හෝ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) යටතේ ඇති ඉංජිනේරු තාක්ෂණ ආයතනය (IET) මඟින් පවත්වන ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමා (NDES) පාඨමාලාවක **පුරප්පාඩුවක් පිරවීමට** තෝරාගත් සිසුවෙකුට හිමි නොවේ.

සටහන **7 :** **ලියාපදිංචිවීම සඳහා ඉහත 6 ඡේදයේ සඳහන් කරන ලද ආයතනයක් විසින් ලබා දී ඇති අවසාන දින සිට දින 60 ක කාලයක් ඇතුළත අදාළ ආයතනය මඟින් පවත්වනු ලබන පාඨමාලාවක ලියාපදිංචිය අවලංගු කරගත් අයදුම්කරුවකු එම ආයතනයෙන් නිකුත් කරන ලද ලියාපදිංචිය අවලංගු කර ගැනීමේ ලිපියේ පිටපතක් අයදුම්පත සමඟ එවිය යුතුය.**

7. ප්‍රථම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් විදේශ ශිෂ්‍යත්වයක් ලබා ගත් සිසුන්.
8. ඉහත 2,3,4,5,6 සහ 7 යන ඡේද යටතේ සඳහන් උසස් අධ්‍යාපන ආයතනයකින් දැනටමත් ප්‍රථම උපාධියක් හෝ අදාළ සුදුසුකමක් ලබා ඇති සිසුන්.
9. විශ්වවිද්‍යාල ප්‍රවේශය සහ/හෝ ඒහි ලියාපදිංචිය සඳහා මෙම අධ්‍යයන වර්ෂයේ හෝ පෙර අධ්‍යයන වර්ෂයකදී අසත්‍ය තොරතුරු ප්‍රකාශ කර ඇති සහ/හෝ ව්‍යාජ ලියකියවිලි ඉදිරිපත් කර ඇති සිසුන්.

සටහන **8 :** **යම් ලෙසකින් විශ්වවිද්‍යාලයකට/උසස් අධ්‍යාපන ආයතනයකට ඇතුළත් කර ගැනීමට පෙර විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමේදී හෝ ලියාපදිංචිය සඳහා ශිෂ්‍යයා විසින් සපයන ලද තොරතුරු වැරදි හෝ අසත්‍ය බව අනාවරණය වුවහොත් එම අධ්‍යයන වර්ෂයට අදාළ ඔහුගේ/ඇයගේ විශ්වවිද්‍යාල තේරී පත්වීම් සහ විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත අවලංගු කිරීමට කටයුතු කරන අතර ඉන් ඉදිරියට කිසිදු අධ්‍යයන වර්ෂයකදී යළිත් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට එම ශිෂ්‍යයාට අවසර දෙනු නොලැබේ.**

**තව ද, යම් ලෙසකින් විශ්වවිද්‍යාලයකට/උසස් අධ්‍යාපන ආයතනයකට ඇතුළත් කරගැනීමෙන් පසු විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමේදී හෝ ලියාපදිංචිය සඳහා ශිෂ්‍යයා විසින් සපයන ලද තොරතුරු වැරදි හෝ අසත්‍ය බව අනාවරණය වුවහොත් එම ශිෂ්‍යයා අදාළ විශ්වවිද්‍යාලයෙන්/උසස් අධ්‍යාපන ආයතනයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.**

## අනෙකුත් වැදගත් තොරතුරු

### (අ) පසුගිය අධ්‍යයන වර්ෂය (එනම් 2023/2024 අධ්‍යයන වර්ෂය) සඳහා අදාළ කඩඉම් ලකුණු

පසුගිය අධ්‍යයන වර්ෂය (එනම් 2023/2024 අධ්‍යයන වර්ෂය) සඳහා අදාළ කඩඉම් ලකුණු https://ugc.ac.lk/handbook/ යන වෙබ් සබැඳියෙහි 9 කොටස යටතේ දක්වා ඇත.

**මෙම කඩඉම් ලකුණු ලබා දී ඇත්තේ විවිධ අධ්‍යයන පාඨමාලා සඳහා ඇති ඉල්ලුම් රටාව පිළිබඳ අදහසක් අයදුම්කරුවන්ට ලබා දීම සඳහා පමණි. කඩඉම් ලකුණු අධ්‍යයන වර්ෂ අතර වෙනස් විය හැකි බැවින්, තීරණ ගැනීමේදී කරුණාකර 2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා ප්‍රකාශයට පත් කරන ලද කඩඉම් ලකුණු මත පමණක් රඳා නොසිටින මෙන් උපදෙස් ලබා දෙනු ලැබේ. මෙම කඩඉම් ලකුණු, 2024/2025 අධ්‍යයන වර්ෂය සඳහා නිකුත් කිරීමට නියමිත කඩඉම් ලකුණු කෙරෙහි බලපෑමක් ඇති කරනු නොලැබේ.**

### (ආ) අයදුම්පතෙහි පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා කැමැත්තේ අනුපිළිවෙල සඳහන් කිරීම

2024/2025 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රාජ්‍ය විශ්වවිද්‍යාල 16ක්, මණ්ඩප 02 ක් සහ උසස් අධ්‍යාපන ආයතන 02 ක් මඟින් විවිධ උපාධි පාඨමාලා 126 ක් පවත්වනු ලබයි.

සෑම විශ්වවිද්‍යාලයක්/ මණ්ඩපයක්/ උසස් අධ්‍යාපන ආයතනයක් මඟින්ම පවත්වනු ලබන එක් එක් අධ්‍යයන පාඨමාලා සඳහා එකිනෙකට අනන්‍ය වූ කේතයක් ලබා දී ඇත. මෙම කේතය "**Uni-Code**" ලෙස හැඳින්වේ. සියලු කේත (Uni-Code) සංඛ්‍යාව 261 කි. කේත සියල්ල අඩංගු ලැයිස්තුව 2024/2025 අධ්‍යයන වර්ෂයට අදාළ විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතේ **පිටු අංක** 143-149 හි දක්වා ඇත.

සෑම අපේක්ෂකයෙකුටම තමන් ඇතුළත්වීමට සුදුසුකම් ලබන "Uni-Codes" (එනම් පාඨමාලා සහ විශ්වවිද්‍යාල) කැමති සංඛ්‍යාවක් සඳහා ඉල්ලුම් කළ හැකිය. නමුත් කිසිදු ශිෂ්‍යයෙකු කේත (Uni-Codes) 261 සඳහාම අයදුම් කිරීමට කිසිදු ලෙසකින් සුදුසුකම් නොලබයි. තමන් සුදුසුකම් ලබන පාඨමාලා මොනවාද යන්න අ.පො.ස. ( උසස් පෙළ) විභාගයේදී පෙනී සිටි විෂයයන් අනුව තීරණය වේ. කෙසේ වෙතත්, ප්‍රවේශය සඳහා අයදුම් කිරීමේදී සිසුන්ට උපරිම වශයෙන් තේරීම් 125 ක් ලකුණු කිරීම සඳහා අවස්ථාව ලබාදී ඇත.

ඒ සඳහා තමන්ගේ කැමැත්ත ප්‍රකාශ කළ යුත්තේ පිළිවෙළින් වැඩි කැමැත්තක් ඇති කේතයේ (Uni-Code) සිට අඩු කැමැත්තක් ඇති කේතය (Uni-Code) දක්වා වේ. මෙහිදී අපේක්ෂකයාගේ කැමැත්ත අඩුවන ආකාරයට කේතයන් (Uni-Codes) පෙළ ගැස්විය යුතුය. කැමැත්තේ අනුපිළිවෙළ සඳහන් කිරීමේදී එකම කේතය (Uni-Code) එක් වරකට වඩා ඇතුළත් කිරීමට ඉඩදෙනු නොලැබේ.

**ප්‍රවේශය සඳහා තෝරා ගැනීමේදී, අපේක්ෂකයා කැමැත්ත දක්වා ඇති අධ්‍යයන පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය යන කරුණු දෙකම එකවර සළකා බලනු ලැබේ.**

සැම විටම තමන් සුදුසුකම් ලබන උපරිම කේත (Uni-Codes) සංඛ්‍යාවක් සිය අයදුම්පතෙහි සඳහන් කිරීමට අයදුම්කරුවන්ට තරයේ උපදෙස් දෙනු ලැබේ. අයදුම්කරුවන් සළකා බලනු ලබන්නේ තමන් විසින් මනාපය දක්වා ඇති අධ්‍යයන පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා පමණි. **අයදුම්කරුවන් විසින් කැමැත්ත ප්‍රකාශ කර නොමැති අධ්‍යයන පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා ඔවුන් සළකා බලනු නොලැබේ.** ඒ අනුව, යම් කිසි ශිෂ්‍යයෙකු යම් විශ්වවිද්‍යාලයක පවත්වන යම් අධ්‍යයන පාඨමාලාවකට (Uni-Code) ඉසෙඩ් අගය අනුව සුදුසුකම් ලැබුවත් එම කේතය (Uni-Codes) සඳහා ඔහු/ඇය විසින් මනාපයක් සඳහන් කර නොමැති නම් ඒ සඳහා ඔහු/ඇය අනුයුක්ත නොකරන අතර ඒ වෙනුවට ඔහු/ඇය විසින් ඊළඟට මනාපය දක්වා ඇති පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය (“Uni-Code”) සඳහා ඔහු/ඇය සළකා බලනු ලැබේ.

සටහන 9 : **“Uni-Codes” භාවිත කර කැමැත්තේ අනුපිළිවෙල සඳහන් කිරීමට අවශ්‍ය උපදෙස් සඳහා 2024/2025 අධ්‍යයන වර්ෂයට අදාළ ප්‍රවේශ අත්පොතෙහි 3 වන කොටස කියවන මෙන් අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.**

සටහන 10 : **කිසියම් ශිෂ්‍යයෙකු කිසියම් විශ්වවිද්‍යාලයක් මඟින් පවත්වනු ලබන යම් පාඨමාලාවක් (Uni-Code) සඳහා තේරී පත්වී ඒ සඳහා ලියාපදිංචි නොවුනහොත්, පුරප්පාඩු පිරවීමේ වටයන්හීදී ඔහු/ඇය එම පාඨමාලාව පවත්වන වෙනත් විශ්වවිද්‍යාල සඳහා සිය විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පතෙහි ඉහළ මනාපයන් දක්වා තිබුණ ද ඒ කිසිදු විශ්වවිද්‍යාලයක් සඳහා එම පාඨමාලාව හැදෑරීම පිණිස ඔහුගේ/ඇගේ අයදුම්පත යළි සළකා බලනු නොලැබේ. ඒ වෙනුවට, ඔහු/ඇය ඊළඟට ඉහළ මනාපය සඳහන් කර ඇති අනෙක් පාඨමාලාව සඳහා ඔහුගේ / ඇයගේ අයදුම්පත සළකා බලනු ලැබේ.**

**මේ පිළිබඳව වැඩිදුරටත් පැහැදිලි කර ගැනීම සඳහා 2024/2025 අධ්‍යයන වර්ෂයට අදාළ විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි පිටු අංක 117-118 හි “වැදගත්” යනුවෙන් සඳහන් කර ඇති නිදර්ශනය කියවා බලන මෙන් අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.**

**(ඇ) <u>ප්‍රායෝගික/යෝග්‍යතා පරීක්ෂණය සමත් වීමේ අවශ්‍යතාවය</u>**

පහත දැක්වෙන අධ්‍යයන පාඨමාලාවන් සඳහා ඇතුළත්වීමට අදහස් කරන අපේක්ෂකයන් අදාළ විශ්වවිද්‍යාල මඟින් පවත්වන ප්‍රායෝගික/යෝග්‍යතා පරීක්ෂණයකට ද පෙනී සිටීම සඳහා ඉල්ලුම් කර එය සමත් විය යුතුය. **අදාළ විශ්වවිද්‍යාල පුවත්පත් දැන්වීමක්/ ඔවුන්ගේ නිල විශ්වවිද්‍යාල වෙබ් අඩවි වල දැන්වීමක් මඟින් ප්‍රායෝගික/යෝග්‍යතා පරීක්ෂණ සඳහා අයදුම්පත් කැඳවනු ලබන අතර සිසුන් විසින් තම ප්‍රායෝගික/යෝග්‍යතා පරීක්ෂණ සඳහා අයදුම්පත් කෙලින්ම අදාළ විශ්වවිද්‍යාලය වෙත යොමු කළ යුතුය.**

ඒ පිළිබඳ වැඩි විස්තර අදාළ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීගෙන් ලබා ගත හැකිය. ප්‍රායෝගික/යෝග්‍යතා පරීක්ෂණ පවත්වනු ලබන විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනවල දුරකතන අංක ප්‍රවේශ අත්පොතේ 197 සහ 198 පිටු වල දක්වා ඇත. **කෙසේ නමුත්, අදාළ පාඨමාලාව සඳහා සළකා බැලීමට නම් ප්‍රායෝගික/යෝග්‍යතා පරීක්ෂණය සමත් වීමට අමතරව අදාළ පාඨමාලාවේ කඩඉම් ලකුණ සම්පූර්ණ කර තිබීම ද අනිවාර්ය වේ.**

| අධ්‍යයන පාඨමාලාව | විශ්වවිද්‍යාලය / මණ්ඩපය / ආයතනය | කේතය (Uni-Code) |
|---|---|---|
| කලා (SP) - ජනමාධ්‍ය | ශ්‍රීපාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය | 020S |
| කලා (SP) - ප්‍රසංග කලා | ශ්‍රීපාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය | 041S |
| වාස්තු විද්‍යාව | මොරටුව විශ්වවිද්‍යාලය | 023G |
| නිර්මාණවේදය | මොරටුව විශ්වවිද්‍යාලය | 024G |
| විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය | මොරටුව විශ්වවිද්‍යාලය | 034G |
| සංගීතය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 068C |
| සංගීතය | යාපනය විශ්වවිද්‍යාලය | 068E |

| අධ්‍යයන පාඨමාලාව | විශ්වවිද්‍යාලය / මණ්ඩපය / ආයතනය | කේතය (Uni-Code) |
|---|---|---|
| සංගීතය | ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය, නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව | 068Y |
| සංගීතය | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 068Z |
| නැටුම් | යාපනය විශ්වවිද්‍යාලය | 069E |
| නැටුම් | ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය, නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව | 069Y |
| නැටුම් | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 069Z |
| චිත්‍ර සහ නිර්මාණ | යාපනය විශ්වවිද්‍යාලය | 070E |
| නාට්‍ය සහ රංග කලා | ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය, නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව | 071Y |
| නාට්‍ය සහ රංග කලා | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 071Z |
| දෘශ්‍ය සහ තාක්ෂණික කලා | ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය, නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව | 072Y |
| ශාරීරික අධ්‍යාපනය | යාපනය විශ්වවිද්‍යාලය | 081E |
| ශාරීරික අධ්‍යාපනය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 081L |
| ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 082C |
| ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය | කැලණිය විශ්වවිද්‍යාලය | 082D |
| ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 082L |
| දෘශ්‍ය කලා | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 085Z |
| භූමි නිර්මාණවේදය | මොරටුව විශ්වවිද්‍යාලය | 097G |
| සිනමා හා රූපවාහිනී අධ්‍යයන | කැලණිය විශ්වවිද්‍යාලය | 100D |

**(ඇ)** **<u>තේරී පත්වූ පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා ලියාපදිංචි වීම</u>**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2024/2025 අධ්‍යයන වර්ෂය සඳහා අදාළ කඩඉම් ලකුණු නිකුත් කිරීමෙන් පසු විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා තෝරා ගනු ලැබූ අයදුම්කරුවන් වෙත තමා තේරී පත්වූ පාඨමාලාව සහ එම පාඨමාලාව හැදෑරීමට අනුයුක්ත කොට ඇති විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දැනුම් දෙනු ලැබේ. ප්‍රවේශ අත්පොතෙහි 1.6(5), 1.6(6) සහ 4.1 යන ඡේදයන්ට අනුව, අයදුම්කරුවන් එම තෝරා ගැනීම භාර ගන්නේ නම් බැංකුවට හෝ අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට බැර වන සේ ලියාපදිංචි ගාස්තු ලෙස රු.50/- ක මුදල ගෙවා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය හරහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ලියාපදිංචිවීම සඳහා ලබා දුන් අවසාන දින හෝ එදිනට පෙර තමන් සුදුසුකම් ලැබූ පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා ලියාපදිංචි විය යුතුය.

තව ද, බැංකුවට මුදල් ගෙවූයේ නම්, ඒ බව සනාථ කිරීම සඳහා ගෙවීම් වවුචරයේ ස්කෑන් කරන ලද පිටපත අන්තර්ජාලය හරහා ලියාපදිංචිවීමේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කළ යුතුය (Upload).

අන්තර්ජාලය හරහා ලියාපදිංචිවීමෙන් අනතුරුව එසේ ලියාපදිංචිවීමෙන් ලද මුද්‍රිත පිටපත (Online Payment Receipt) නිසි පරිදි අත්සන් කර, බැංකුවට මුදල් ගෙවූයේ නම් මුදල් ගෙවූ බවට ලිඛිත සාක්ෂි ද සමඟ [ගෙවීම් වවුචරය] ලියාපදිංචි තැපෑලෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට එවිය යුතුය.

සටහන **12 :** **තේරී පත්වූ පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා අන්තර්ජාලය හරහා ලියාපදිංචිවීම ද 2024/2025 අධ්‍යයන වර්ෂය සඳහා අනිවාර්ය අවශ්‍යතාවයක් බව සළකන්න.**

සටහන **13 :** **අන්තර්ජාලය හරහා ලියාපදිංචිය අවසානයේදී නවකවදය පිටු දැකීම සඳහා වූ ශිෂ්‍යයාගේ/ ශිෂ්‍යාවගේ ප්‍රකාශය ද භාගත කර A4 ප්‍රමාණයේ කොළයක දෙපැත්තේම මුද්‍රණය කර එය නිසි පරිදි**

**පුරවා අත්සන් කර විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමේදී අනිවාර්යයෙන්ම භාරදිය යුතුය. මුද්‍රිත පිටපත තැපෑලෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත එවීම අවශ්‍ය නොවේ.**

**(ඉ) අන්තර්ජාලය ඔස්සේ විශ්වවිද්‍යාල අයදුම්පත පිරවීම පිළිබඳව නිසි අවබෝධයක් ලබා ගැනීම පිණිස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙහි (www.ugc.ac.lk) පළ කර ඇති වීඩියෝව ද පරිශීලනය කරන මෙන් අයදුම්කරුවන්ට මෙයින් උපදෙස් ලබා දෙමි.**

සභාපති
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත බෙදා හැරීමේ නියෝජිතයන්**
**අධ්‍යයන වර්ෂය - 2024/2025**

01. කොළඹ -

එස් .ගොඩගේ සහ සහෝදරයෝ, 675, මරදාන පාර, කොළඹ 10.
සදීපා පොත්හල, 1060, මරදාන පාර, බොරැල්ල, කොළඹ 08.
විජිතයාපා පොත්හල, 130, එස් ද එස් ජයසිංහ මාවත, කොහුවල, නුගේගොඩ.
විජිතයාපා පොත්හල, යුනිටි ප්ලාසා,02 ගාලු පාර කොළඹ 04
විජිතයාපා පොත්හල, 32,තර්ස්ටන් පාර, කොළඹ 03
විජිතයාපා පොත්හල,ජී 6 ඒ, ක්‍රෙරෙස්කැට් බෝල්වර්ඩ්, කොළඹ 03.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම,30, ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම,44/9,වයි.එම්.බී.ඒ ගොඩනැගිල්ල, කොටුව.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම,70/1/5, වයි.එම්.බී.ඒ ගොඩනැගිල්ල, බොරැල්ල.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම,74, හයිලෙවල් පාර, මහරගම.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, 92 ඒ, පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, 592, මරදාන පාර, කොළඹ 10.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, 4 වන මහල, වන් ගොල්ෆේස් සාප්පු සංකීර්නය, කොළඹ 02.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, 02, ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො 02 බී, සමුද්‍රදේවී මාවත,නුගේගොඩ.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො 24, හිල් වීදිය, දෙහිවල.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම,නො 20 ඒ, හිල් වීදිය, දෙහිවල.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො 70/1/2, වයි.එම්.බී.ඒ ගොඩනැගිල්ල, කොළඹ 08.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො 14,උද්‍යාන පාර, පිළියන්දල.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො 47, ආර්ථික මධ්‍යස්ථානය, නාරාහේන්පිට.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො 147, ශාන්ත මයිකල් පාර, කොළඹ 03.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, කාන්තා විද්‍යාලය, නො 66, අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, 1/50, වයි.එම්.බී.ඒ ගොඩනැගිල්ල, බොරැල්ල.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම,නො 82, මොරටුව පාර, පිළියන්දල.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො 175, හොරණ පාර, කොට්ටාව, පන්නිපිටිය
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො 413, බෞද්ධාලෝක මාවත, කොළඹ 07
සසිරි (ප්‍රයිවට්) ලිමිටඩ්, 14 හයිලෙවල් පාර, මහරගම

සරසවි මාර්කටින් එන්ටප්‍රයිසස්, යූ ජී 19, පීපල්ස් පාක්, ගුණසිංහපුර, කොළඹ 11.
පූබාලසිංහම් පොත් වෙළඳ සැල , 340, හෙට්ටි වීදිය, කොළඹ 11.
තුසිත පොත්හල (පුද්ගලික) සමාගම, 433 Q, ගාලු පාර, රත්මලාන.
සිතුරුවන පොත්හල, නො 08, ඉංගිරිය පාර, පාදුක්ක.
වික්ටරි පොත්හල, 21, යටියන්තොට පාර, අවිස්සාවේල්ල.
සනිල පොත්හල, 323, කඩුවෙල පාර, බත්තරමුල්ල.
සතරක පොත්හල, 09, පන්නිපිටිය පාර, බත්තරමුල්ල.
සීවලී පොත්හල, ඒ /39, හරස් පාර, හංවැල්ල.
සිතුමිණ පොත්හල, අංක 62, කෙලින් වීදිය, අතුරුගිරිය.
සමුද්‍රා පොත්හල, නො 1141, මරදාන පාර, බොරැල්ල.
සුභසාධක සංගමය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිශන් සභාව, 20, වෝඩ් පෙදෙස, කොළඹ 07.
සඳලි පොත්හල, 76/4, සේනානයක සංකීර්ණය, හෝමාගම.
ස්ටයිලිස් පොත්හල, 18/බී, ද මැල් පටුමග, මොරටුව.
ශ්‍රී ලංකා පොත්හල, අංක 27, මහ වීදිය, පිළියන්දල.
ඔනිරෝ පොත් මැදුර, 87, හයිලෙවල් පාර, මහරගම.
විදුලක අධ්‍යාපනික ප්‍රකාශන පුද්ගලික සමාගම, 50/22, මහාමේඝ වත්ත, මහරගම.
ග්‍රන්ථාලෝක මුද්‍රණාලය සහ පොත්හල, 12, හයිලෙවල් පාර, කොට්ටාව, පන්නිපිටිය.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො 16, හොරණ පාර, පාදුක්ක
නව ගයාන් පොත්හල, නො 14, හයිලෙවල් ප්ලාසා, දෙල්කඳ, නුගේගොඩ.
ලුම්බිණි පොත් මැදුර, නො 17, සරණපාල හිමි මාවත, පිළියන්දල.
නව සේනාධීර පොත්හල, නො 13,1- හයිලෙවල් පාර, හෝමාගම.
දිනෙන පොත්හල, නො 28/සී, දුම්රියපල පාර, හෝමාගම.
ආසිරි පොත්හල, 10, පාදුක්ක පාර, ගොඩගම, හෝමාගම.
සිතුරුවන පොත්හල(පුද්ගලික) සමාගම, නො 61, මහ විදීය,හංවැල්ල.
සිතුරුවන පොත්හල(පුද්ගලික) සමාගම,නො 112, හයිලෙවල් පාර, මීපේ හන්දිය, පාදුක්ක.
සිතුරුවන පොත්හල(පුද්ගලික) සමාගම, නො 20, එම්.ඩී.එච්. ජයවර්ධන මාවත, හොරණ පාර, පාදුක්ක.
සිතුරුවන පොත්හල,33/ඒ, හොරණ පාර, පාදුක්ක
මැක්මිලන් පොත්හල, නො 195, ඔල්කට් මාවත, කොළඹ 11.
සුසර ප්‍රකාශන (පුද්ගලික) සමාගම, 180/43, පීපල්ස් පාක්, කොළඹ 11.
ඇම්.ඩී. ගුණසේන සහ (පුද්ගලික) සමාගම, 217,ඔල්කට් මාවත, කොළඹ 11.
ඇම්.ඩී. ගුණසේන සහ (පුද්ගලික) සමාගම,27, ගාලු පාර, බම්බලපිටිය.
ඇම්.ඩී. ගුණසේන සහ (පුද්ගලික) සමාගම, 1129, මරදාන පාර, කොළඹ 08.
ඇම්.ඩී. ගුණසේන සහ (පුද්ගලික) සමාගම, 133 ඩී, වජිර පාර, කොළඹ 05.
ඇම්.ඩී. ගුණසේන සහ (පුද්ගලික) සමාගම,20, සැන් සෙබස්තියන් හිල්ස්, කොළඹ 12.
ඇම්.ඩී. ගුණසේන සහ (පුද්ගලික) සමාගම, 73, රත්නපුර පාර, අවිස්සාවේල්ල.
චන්ද්‍රා මුද්‍රණ ශිල්පියෝ, නො 89, හොරණ පාර, පිළියන්දල.
චන්ද්‍රා මුද්‍රණ ශිල්පියෝ , නො 13, හොරණ පාර, පොල්ගස්ඕවිට.
නිකෝලි පොත්හල, නො 62, දෙහිවල පාර, මහරගම.
සිතුමිණ පොත්හල, 8 ඒ, ගොඩගම පාර, අතුරුගම.
ලුමිනෙක්ස් පොත්හල (පුද්ගලික) සමාගම, නො 646, ගාලු පාර, මොරටුව.
ලුමිනෙක්ස් පොත්හල (පුද්ගලික) සමාගම, නො 91/බී, හොරණ පාර, පිළියන්දල.
සඳලි පොත්හල, සඳලි පොත්හල නගරය, නො 60, කටුවන පාර, හෝමාගම.
සඳලි පොත්හල, නව සඳලි පොත්හල,කටුවන පාර, හෝමාගම.
සමනල රීඩ්රයිට් ඉන්ටර්නැශනල් පුද්ගලික සමාගම, නො 494, දෙවන හරස් පාර, මරදාන.

02. ගම්පහ - ශාන්ති පොත්හල, 50, කෙලින් වීදිය, ගම්පහ.
කේ.ඒ. ආරියදාස සහ සමාගම, 32, කෙලින් වීදිය, වේයන්ගොඩ.
සම්පත් පාලිත ද සේරම් පොත් සමාගම, අංක 60, සම්පත් ෆිනෑන්ස් බිල්ඩිං, නුවර පාර, කිරිබත්ගොඩ.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම,87 , මීනුවන්ගොඩ පාර, ගම්පහ
විජිතයාපා පොත්හල,135 , රාජපක්ෂ බ්‍රෝඩ්වේ , මීගමුව
රෝහන පොත්හල සහ හාර්ඩ්වෙයාර් ස්ටෝර්ස්, නව නුවර පාර, දෙල්ගොඩ.
දිලීපා පොත්හල, නො 07, පස්යාල පාර, මීරිගම.
ගංගා පොත්හල, 134, නුවර පාර, නිට්ටඹුව.
සරසවි පොත්හල, නො 36, කෙලින් වීදිය, ගම්පහ.
පර්නෝ ස්ටේෂනරීස්, නො. 92, මීගමු පාර, ජා ඇල.
සරසවි පොත්හල, නො. 37, මීරිගම.
මහජන පොත්හල, 141, සේරම් ගොඩනැගිල්ල, නුවර පාර, කඩවත.
ආසිරි ට්‍රේඩර්ස්, නො.18, කුරුණෑගල පාර, මීනුවන්ගොඩ.
දිස්නා පොත්හල, නො 650, අත්තනගල්ල පාර, නිට්ටඹුව.
චන්මිනි පොත්හල, 20/5, පස්යාල පාර, මීරිගම.
මින්සර පොත්මැදුර,අංක 12, තානායම පාර, ගම්පහ.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම,නො 134 ඒ, පැරණි මීගමු පාර, වත්තල.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම,නො. 151/1,නුවර පාර, කිරිබත්ගොඩ.
ෆොන්සේකා පොත්හල, 77, හලාවත පාර, කොච්චිකඩේ.
නිව් ආසිරි පොත්හල, අංක 18, දිවුලපිටිය පාර, මීනුවන්ගොඩ.
ජයන්ති පොත්හල සහ ලිපිද්‍රව්‍ය, ගම්පහ පාර, කිරිදිවෙල.
සමනල රීඩ්රයිට් ඉන්ටර්නැෂනල් (පුද්ගලික) සමාගම ,19 , සිරිවර්ධන මාවත, මීනුවන්ගොඩ.
සමනල රීඩ්රයිට් ඉන්ටර්නැශනල් (පුද්ගලික) සමාගම, අංක 136, මීගමුව පාර, නාගොඩ, කඳාන.
ඇම්.ඩී. ගුණසේන සහ (පුද්ගලික) සමාගම, 4, නුවර පාර, කිරිබත්ගොඩ.
ඇම්.ඩී. ගුණසේන සහ (පුද්ගලික) සමාගම, 7 බී, මංගල පාර, ගම්පහ.
ඇම්.ඩී. ගුණසේන සහ (පුද්ගලික) සමාගම, අංක 64, ද කෲස් පාර, මීගමුව.
විජිතයාපා පොත්හල, මීගමු ප්‍රකාශකයෝ , මීගමුව.
සොනාලි පොත්හල සහ බියුටි කෙයා, නො. 24/ඒ, දිවුලපිටිය පාර, මීනුවන්ගොඩ.
විනර්ස් පොත්හල, නො. 55, කුරුණෑගල පාර , මීනුවන්ගොඩ.
ආනන්ද ප්‍රින්ට මුද්‍රණ ශිල්පියෝ පොත්හල සහ ප්‍රකාශකයෝ, නො. 54 ඩී, රදාවාන පාර, යක්කල.
මහජන පොත්හල, නො 6/ඒ, නුවර පාර, කිරිබත්ගොඩ.
දිස්නා පොත්හල, නො 23, සුසිරි වෙළඳ සැල උඩුමහල, නිට්ටඹුව.
මින්සර පොත් මැදුර, නො 80, බෞද්ධාලෝක මාවත, ගම්පහ.
මින්සර පොත් මැදුර,නො. 84, ද කෲස් පාර, මීගමුව.
මින්සර පොත් මැදුර,නො. 154/2, නුවර පාර, කඩවත.
සමනල රීඩ්රයිට් ඉන්ටර්නැෂනල් (පුද්ගලික) සමාගම, නො. 968, කොළඹ පාර, කටුනායක.
සමනල රීඩ්රයිට් ඉන්ටර්නැශනල් (පුද්ගලික) සමාගම, නො. 169, ග්‍රීන් පාර, මීගමුව.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො. 867, මීගමුව පාර, වත්තල.
චන්ද්‍රිකා පොත්හල, අංක 53, වෙලදපොල පාර, ගම්පහ.
සුසර ප්‍රකාශන (පුද්ගලික) සමාගම, 65, මාකොළ පාර, කිරිබත්ගොඩ.

03. කළුතර - ඕකිඩ් එන්ටප්‍රයිසස්, 109, අගුරුවාතොට පාර, හොරණ.
විජය පොත්හල, 20, අලුත්ගම පාර, මතුගම.
විජය පොත්හල, 54 ඊ, කෙලින් වීදිය, කළුතර දකුණ.
ලක් ඉසුරු පුද්ගලික සමාගම, 324, කෙලින් වීදිය, පානදුර.
නිව් ප්‍රදීපා පොත්හල, නො 51/සී, කළුතර පාර, බණ්ඩාරගම.
නව නිපුන පොත්හල, 404, තුංමං හන්දිය, ගාලු පාර, කළුතර දකුණ.

වාද්දුව පොත්හල, ගාලු පාර, වාද්දුව.
ලුමිනෙක්ස් ග්‍රොසරිස් ප්‍රයිවෙට් ලිමිටඩ්, 465, ගාලු පාර, පානදුර.
ගොඩගේ සහ සහෝදරයෝ, නො. 507, ගාලු පාර, පානදුර.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො.41, අගුරුවාතොට පාර, හොරණ.
විජය පුවත්පත්හල, රත්නපුර පාර, බදුරලිය.
සවිදු පොත්හල, නො 20, රත්නපුර පාර, ඉංගිරිය.
රන්සික පොත්හල, 437/18, මතුගම පාර, අඹගහ හන්දිය, දර්ගා නගරය.
ඇම්.ඩී. ගුණසේන සහ (පුද්ගලික) සමාගම,අංක 377 ඩී, ගාලුපාර, පානදුර.
ඇම්.ඩී. ගුණසේන සහ (පුද්ගලික) සමාගම,අංක 92, ගාලු පාර, කළුතර දකුණ.
සරසි පොත්හල, නො. 05, ගාමිණී පාර, මතුගම.
පුවත්පත් වෙළඳ සැල, නො. 03, දුම්රියපොල පාර, කළුතර දකුණ.
ගාල්ල පොත්හල සහ බෙදාහරින්නො, නො. 91, අඟුරුවාතොට පාර, හොරණ.
උදය ශෝරුම් , කෙලින් වීදිය, ඉංගිරිය.
පත්මසිරි පොත්හල, අංක 16, අගලවත්ත පාර, මතුගම.
ජමියාහ් පොත්හල සහ කොමියුනිකේෂන්, නො. 10 සී, වටල්පොල පාර, හේනමුල්ල, පානදුර.
ලුමිනෙක්ස් පොත්හල පුද්ගලික සමාගම, නො 232, කෙලින් වීදිය, කළුතර දකුණ.
ලුමිනෙක්ස් පොත්හල පුද්ගලික සමාගම, නො 416,ගාලු පාර, පානදුර.
ලුමිනෙක්ස් පොත්හල පුද්ගලික සමාගම, නො 144/බී, රත්නපුර පාර, හොරණ.
ලුමිනෙක්ස් පොත්හල පුද්ගලික සමාගම, නො. 87, ඉන(ර්) ස(ර්)කියුල පාර, කළුතර.
මින්සර පොත් මැදුර, නො. 55 ඊ, කෙලින් වීදිය, කළුතර දකුණ.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො .169/1, පානදුර පාර, හොරණ.

04. මාතලේ -

මාලක ට්‍රේඩර්ස් (පුද්ගලික) සමාගම, 55/57, කෙලින් වීදිය, මාතලේ.
අමරසිංහ සහ පුත්‍රයෝ, නො.07, දඹුල්ල පාර, මාතලේ හන්දිය, ගලේවෙල.
සුමඟ පොත්හල, නො 06, මාතලේ පාර, උකුවෙල.
නව ජයතිස්ස පොත්හල,469, කුරුණෑගල හන්දිය, දඹුල්ල.
නව ජයතිස්ස පොත්හල, අනුරාධපුර පාර, දඹුල්ල.

05.මහනුවර -

විජිතයාපා පොත්හල, 05, කොටුගොඩැල්ල වීදිය, මහනුවර.
දවස පොත් මැදුර, අංක12, නුවරඑළිය වීදිය, ගම්පොළ.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, 86, ඩී.එස්. සේනානායක විදිය, මහනුවර.
හරිස්චන්ද්‍ර පොත් මැදුර, නො. 36, හරස් වීදිය, මහනුවර.
ලංකා මධ්‍යම පොත්හල, නො. 84, කොළඹ වීදිය, මහනුවර.
සමුද්‍රා පොත්හල, නො. 74, ඩී.එස්. සේනානායක වීදිය, මහනුවර.
සීවලී පොත්හල, නො 16, යටිනුවර වීදිය, මහනුවර.
විමර්ශි අධ්‍යාපන කවය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො. 21, දෙවන මහළ, කැන්ඩි සිටි සෙන්ටර්, මහනුවර.
කේ.එම්.ඒ. පොත්හල, 56, මාතලේ පාර, අකුරණ.
ඊස්වරන් පොත්හල, අංක 126/1, කොළඹ වීදිය, මහනුවර.
ඇම්.ඩී. ගුණසේන සහ (පුද්ගලික) සමාගම, අංක 33, යටිනුවර වීදිය, මහනුවර.
විජිත යාපා පොත්හල, අංක 20, 2 වන මහල, කැන්ඩි සිටි සෙන්ටර්, මහනුවර.

06.නුවරඑළිය -

කුමාරන්ස් ට්‍රේඩ් (පොත්) සෙන්ටර්, 19, ඩෙලිෆෙයාර් කොම්ප්ලෙක්ස්, මහනුවර පාර, නුවරඑළිය.

නිශාන් පොත්හල, රත්මැටිය පාර, රිකිල්ලගස්කඩ.
චීප් සයිඩ් පොත්හල, නො 40, ගම්පොල පාර, නාවලපිටිය.
චමිලානි කොමියුනිකේශන්, නො. 01, පොදුවෙළඳ පොල, හඟුරන්කෙත.
සමගි පොත්හල, රෝහල පාර, රිකිල්ලගස්කඩ.
සුජායි පොත්හල සහ ග්‍රොසරිය, අංක 40, නිල්දන්ඩාහින්න.
සරසවි ඉලෙක්ට්‍රිකල්ස් ඇන්ඩ් බුක්ෂොප්, අංක 06, නුවර පාර, රිකිල්ලගස්කඩ.

07. ගාල්ල -

විජිතයාපා පොත්හල, නො. 12, වක්වැල්ල පාර, ගාල්ල.
ජී. එච්. ආරියදාස පොත්හල, නො.73, දංගෙදර වීදිය, ගාල්ල.
රෝයල් පොත්හල, 152, මහ වීදිය, අම්බලංගොඩ.
විතාන පොත්හල, 04, බද්දේගම පාර, වදුරඹ.
සේන පොත්හල, ඇල්පිටිය.
ලහිරු පොත්හල, බසාර්, 76, හැව්ලොක් පාර, ගාල්ල.
සමනල ට්‍රේඩර්ස් සහ පොත්හල, කොළඹ පාර, නෙළුව.
ගමගේ පොත්හල, නො 20 , නාගොඩ පාර, බද්දේගම.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම,පළමු මහල, මධ්‍යම බස් නැවතුම්පොළ, ගාල්ල.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො. 107. වක්වල්ල පාර, ගාල්ල.
සමාරා කොමියුනිකේශන්,76 බී,හැව්ලොක් පාර, ගාල්ල.
ඩයමන්ඩ් ඇඩ්වර්ටයිසින්, නො 55, බස් නැවතුම්පොළ වෙළඳ සංකීර්ණය,අම්බලන්ගොඩ.
ඇම්.ඩී. ගුණසේන සහ (පුද්ගලික) සමාගම, අංක 02, මාතර පාර, ගාල්ල.
වෙනස පොත්හල, කන්දෙගොඩවත්ත, යක්කාලමුල්ල, ගාල්ල.
ලුමිනෙක්ස් පොත්හල පුද්ගලික සමාගම,නො 98, ගාලු පාර, අම්බලන්ගොඩ.

08. මාතර -

එච්.බී.එරමානිස් අප්පුහාමි සහ පුත්‍රයෝ,87,ධර්මපාල මාවත,මාතර.
වීරසිංහ පොත්හල,මාතර පාර, කඹුරුපිටිය.
සරසවි පොත්හල(පුද්ගලික) සමාගම,4,දුම්රියපොළ පාර, මාතර.
විජිතයාපා පොත්හල, 5ඒ - 1/1, ධර්මපාල මාවත, මාතර.
විජිතයාපා පොත්හල,අංක 10, හක්මන පාර,මාතර.
හමීම් පොත්හල,නො.07,බෝරාල පාර,වැලිගම.
නිව්පාල ස්ටෝර්ස්,නො.306,පරණ ගාලු පාර,සාප්පු කඩේ,වැලිගම.
ලස්සන පොත්හල,දෙනියාය පාර, මොරවක.
සැඹුකො ඩේටා බියුරෝ සහ පොත්හල, අංක 93,වර්ල්ඩ් මාර්කට්,අකුරැස්ස.
සමුද්‍රා පොත්හල, නො.127, එස්.කේ.සිනමා බිල්ඩින්, තංගල්ල පාර, කොටුවේගොඩ,මාතර.
අබේවික්‍රම පොත්හල,වීරකෝන් වත්ත,ඌරුබොක්ක.
රසික පොත්හල,නො. 50 ඒ, අකුරැස්ස පාර,රාහුල හංදිය,මාතර.
Ebook City.lk, නො.100 ඒ,ගල්බොක්ක පාර, වැලිගම.
ශාන් පොත්හල,අංක 246,ධර්මපාල මාවත,මාතර.
සපිරි පොත් මැදුර,අංක 29,පාසල් මාවත,කඹුරුපිටිය.
සුසර ප්‍රකාශන(පුද්ගලික) සමාගම, අංක 14, ආරියරත්න ගොඩනැඟිල්ල, හක්මන පාර,මාතර.
ඇම්.ඩී.ගුණසේන සහ (පුද්ගලික) සමාගම,අංක 27, අනගාරික ධර්මපාල මාවත, මාතර
එච්.බී.එරමානිස් අප්පුහාමි සහ පුත්‍රයෝ, නො.107,රාහුල පාර,මාතර.
විස්ඩම් පොත්හල, නාගහ හංදිය, ඌරුබොක්ක.

09. හම්බන්තොට -

මුතුමාල පොත්හල,117,මහ වීදිය,තංගල්ල.
එම්.ඒ.එස්. ට්‍රේඩර්ස්,24,සුපර් මාර්කට්,වලස්මුල්ල.
රුක්සෙවන පොත් මැදුර,92,දික්වැල්ල පාර,බෙලිඅත්ත.
ජයසේකර ප්‍රකාශකයෝ,අංක 92,බෙලිඅත්ත පාර,තංගල්ල.
පබසර පොත්හල,56,කොටබෝව,වීරකැටිය.
නව සුමිහිරි ට්‍රේඩ් සෙන්ටර්,නො.11,මහ වීදිය,අම්බලන්තොට.

නිව් ලහිරු පොත්හල,562,හම්බන්තොට පාර,ගඟසිරිපුර,තිස්සමහාරාමය.
සරීනාස් ග්‍රොසරි,මිද්දෙනිය පාර,කොටබොා,වීරකැටිය.
යෙනුලි පොත්හල සහ කොමියුනිකේෂන්,අංක 10, රන්න පාර, අඟුණකොළපැලැස්ස.
අබේසිංහ පොත් මැදුර,තලාව පාර,මිද්දෙණිය.
සීවලි පොත් මැදුර,විද්‍යාල මාවත,සූරියවැව නගරය.

10. යාපනය -

පූබාලසිංහම් පොත්හල,04,රෝහල පාර,යාපනය.
මැක්මිලන් පොත්හල,නො.03,බස් නැවතුම්පල,යාපනය.
තුර්කා ස්ටේෂනර්ස්,බස් නැවතුම,චුන්නාකම්.
අන්නායි පොත්හල,නො.7 Z,රෝහල පාර,යාපනය.

11. වවුනියාව -

රාමචන්දිරාස්,නො.20 ඒ,බස්නැවතුම්පොළ සංකීර්ණය,වවුනියාව.

12. ත්‍රිකුණාමලය -

රේන්බෝ මිනිලැබ් (පුද්ගලික) සමාගම, 113, විද්‍යාල පාර, ත්‍රිකුණාමලය.
සූර්ෆා කොමියුනිකේෂන් ස්ටේෂනරීස් සහ මල්ටි ට්‍රේඩර්ස්,160,කෙලින් වීදිය,කින්නියා - 03.
සූර්ෆා කොමියුනිකේෂන් ස්ටේෂනරීස් සහ මල්ටි ට්‍රේඩර්ස්, කෙලින් වීදිය,මුතූර්.
සූර්ෆා කොමියුනිකේෂන් ස්ටේෂනරීස් සහ මල්ටි ට්‍රේඩර්ස්,කෙලින් වීදිය,තොපූර්.
සූර්ෆා කොමියුනිකේෂන් ස්ටේෂනරීස් සහ මල්ටි ට්‍රේඩර්ස්,නුවර පාර, මුල්ලිපොතානයි.

13. මඩකලපුව -

රාජාස් පොත්හල, 111, කෙලින් වීදිය, මඩකලපුව.
නූරි පොත්හල,කෙලින් වීදිය,කත්තන්කුඩි.
ආර්.ඩී.පොත් කේන්ද්‍රය,තගමනිපති,අංක 05, ප්‍රධාන පාර,පෙරියකල්ලාර් - 02 (30250) ,කල්ලාර්.

14. අම්පාර -

ෆොටෝ රියෝ, 120ඒ, කෙලින් වීදිය, කල්මුනේ.
සෙන්ට්‍රල් පොත්හල,පොතුවිල් පාර,අක්කරෙයිපත්තු.
වැලිගම ස්ටෝර්ස්,4 වැනි පටුමග,අම්පාර.
A 2 Z පොත්හල, 154,රෝහල පාර,නින්තාවූර් 15.
වේගා කොමියුනිකේෂන්, 130/3,ෆවුස් මාවත,සමන්තුරෙයි.
ප්ලස් කොම්,84/බී/1,ජී.එම්.එම්.එස්. පාර,සායින්දමරුදු-11.
මෙගාලයින් මෙගා පොත්හල සහ ලිපිද්‍රව්‍ය,53,මහවීදිය,කල්මුනේ.
ඩී-ලින්ක් කමියුනිකේෂන් ඇන්ඩ් ස්ටේෂනරි,මහ වීදිය,පාලමුනේයි.
සයාන් පොත් කේන්ද්‍රය, අම්පාර පාර,සමන්තුරේ.
ප්‍රසාද් පොත්හල,අංක A10, නව නගරය,දෙහිඅත්තකණ්ඩිය.
සයාන් පොත්හල,නො.116,පිලවඩි පාර,සමන්තුරෙයි.

15. පුත්තලම -

සමන්ති පොත්හල, 39, මාරවිල පාර,නාත්තණ්ඩිය.
ද පේපර් හවුස්, 12,කොළඹ පාර, පුත්තලම.
මයුර පොත්හල,08,කොළඹ පාර,හලාවත.
ඇක්මින් පොත්හල,නො 3/5,පුද්ගලික බස් නැවතුම්පළ,හලාවත.
රඹසෙවන පොත්හල,වෙන්නප්පුව.
A 2 Z පොත්හල, 230, මන්නාරම පාර,පුත්තලම.
රෙඩ්සි පොත්හල,නො 02,මහජන බැංකුව අසළ,නාත්තන්ඩිය.
සහිර් ෆැන්සි කොන(ර්) සහ පොත්හල,අංක 09,කුරුණෑගල පාර,පුත්තලම.

16. කුරුණෑගල -

සමුද්‍රා පොත්හල, 10,පුත්තලම් පාර,කුරුණෑගල.
සමුද්‍ර පොත්හල,8/2,මිහිඳු මාවත,කුරුණෑගල.
සමුද්‍ර බුක් ක්‍යුරියෝ,අංක 25/27,පුත්තලම පාර,කුරුණෑගල.
සමුද්‍ර පොත් නිවස,අංක 04,රජපිහිල්ල මාවත,කුරුණෑගල.

සමුද්‍ර කන්සොල්ඩේටඩ් (පුද්ගලික) සමාගම,නො.5, දකුණු වටරවුම් පාර,කුරුණෑගල.
කාරිස් පොත්හල,577,මීගහකොටුව,කුලියාපිටිය.
සරසවි මුද්‍රණ ශිල්පීන් සහ ප්‍රකාශකයෝ,24,දඹුල්ල පාර,කුරුණෑගල.
රිවඩ් ට්‍රේඩින් කම්පැනි (පුද්ගලික) සමාගම,64,පැරකුම්බා වීදිය,කුරුණෑගල.
සරසවි මාර්කටින් එන්ටර්ප්‍රයිසස්, 135, කොළඹ පාර,කුරුණෑගල.
චතුරංග පොත්හල,නො.60,කුරුණෑගල පාර,පන්නල.
මිහිර පොත්හල,41,හලාවත පාර,වාරියපොල.
රීඩර්ස් පොත්හල, බස් නැවතුම්පළ ඉදිරිපිට, 184 A, කුරුණෑගල පාර, නාරම්මල.
සමාධි පොත්හල,අංක 7-8,නව බස් නැවතුම්පල,ගල්ගමුව.
යස ඉසුරු බුක් ෂොප් ඇන්ඩ් ට්‍රේඩ් සෙන්ටර්,39,කුලියාපිටිය පාර,නාරම්මල.
පවිත්‍රා පොත්හල,කෙලින් වීදිය,මහව.
සම්පත් පොත්හල,49,කොළඹ පාර,කුරුණෑගල.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම,නො.56,කොළඹ පාර,කුරුණෑගල.
හන්සිත පොත්හල, 43/1,කුරුණෑගල පාර, වාරියපොළ.
ඇම්.ඩී.ගුණසේන සහ (පුද්ගලික)සමාගම, අංක 67,කොළඹ පාර,කුරුණෑගල.
කුමුදිත පොත්හල,101/C,පුත්තලම් පාර,නිකවැරටිය.
හර්ෂ ප්‍රියා පොත්හල,මීගමුව පාර, මාකඳුර,ගෝනවිල.
සංජීව කොමියුනිකේෂන් සහ පොත්හල, නො 36, නව බස්නැවතුම්පොල, කුලියාපිටිය.
මින්සර පොත් මැඳුර,නො.7,ආනන්ද මාවත,කුලියාපිටිය.
සම්පත් පොත්හල,නො.24,නුවර පාර,කුරුණෑගල.
සමගි පොත්හල, ප්‍රධාන නගර මධ්‍යය, ගල්ගමුව.

17.අනුරාධපුරය-

ගුණසේකර සහ සමාගම, 234, මෛත්‍රීපාල සේනානායක මාවත, අනුරාධපුරය.
බුද්ධික පොත්හල,282, මහ වීදිය,බැංකු පෙදෙස,අනුරාධපුරය.
සංජීව ෆාමසි හා පොත්හල,136, කෙලින් වීදිය, කැකිරාව.
මුතුකුඩ පේපර් කෝනර් සහ ප්‍රින්ටර්ස්, නව නගරය, තඹුත්තේගම.
මුතුකුඩ පේපර් කෝනර්, නො. 34, කැකිරාව පාර, එප්පාවල.
ෆැන්ටා හවුස්,තලාව පාර, එප්පාවල.
සමුද්‍ර කන්සොල්ඩේටඩ් (පුද්ගලික) සමාගම, නො 56/248, නව බස් නැවතුම්පොළ, අනුරාධපුරය.

18.පොළොන්නරුව-

දීපානි පොත්හල, 70 පොදු වෙළඳපොළ, හිඟුරක්ගොඩ.
නිව් දීපානි පොත්හල, අංක 125, ඩී.එස්.සේනානායක වීදිය, හිඟුරක්ගොඩ.
පුවාසා පොත් මැඳුර, රෝහල හන්දිය, පොළොන්නරුව.
පෙපර් ලයිට් පොත්හල, රෝහල පාර, මැදිරිගිරිය.
ප්‍රියංකර පොත්හල, 09, මහ වීදිය, කඳුරුවෙල.
ප්‍රසාද් පොත්හල හා වෙළඳ ව්‍යාපාරය, පාසල් හන්දිය, මැදිරිගිරිය.
නිව් දීපානි පොත්හල, තපොල් මාවත, හිඟුරක්ගොඩ.
පුවාසා පොත් මැඳුර, නො. 27, කෙලින් පාර, කඳුරුවෙල.

19. බදුල්ල -

ජාන්ස් පොත් වෙළඳසැල, 89 පහළ වීදිය, බදුල්ල.
ඊ.එම්.ජී. කරුණාරත්න පොත් වෙළඳසැල, 58, ධර්ම විජය මාවත, බණ්ඩාරවෙල.
ඉසුරු ෆෙයාර්, 80, නුවරඑළිය පාර, වැලිමඩ.
මහින්දාස් පොත්හල, නො.50, 52, බසාර් වීදිය, බදුල්ල.
රිශානා පික්චර් පැලස්, 380, කෙලින් වීදිය, පස්සර.
සිරිමංගල ප්‍රකාශකයෝ, නො. 16, ධර්ම විජය මාවත, බණ්ඩාරවෙල.
වික්රික් මල්ටි වෙළඳසැල (පුද්ගලික) සමාගම, නො. 04, බෞද්ධ මන්දිර පාර, වැලිමඩ.
චැනල් නෙට් පොත්හල, නො. 06, බදුල්ල පාර, මහියංගනය.
විජේවික්‍රම පොත්හල, අංක 38, බදුල්ල පාර,වැලිමඩ.

20. මොණරාගල- මයිසන් ට්‍රේඩ් සෙන්ටර්, නො. 26, කෙලින් වීදිය, මොණරාගල.
ඒ.ඩී.එස්.ඒජන්සීස්, නො. 14, මහ වීදිය, බිබිල.
තරිඳු ගිෆ්ට් සෙන්ටර්,65, තිස්ස පාර, වැල්ලවාය.
සුමධුර පොත්හල, අංක 22, පොතුවිල් පාර, මොණරාගල.
සී.ජී.එම්. පොත් මැදුර, 69, බස් නැවතුම ඉදිරිපිට,වැල්ලවාය.
සුහද පොත්හල, තිස්ස පාර, වැල්ලවාය.

21. කෑගල්ල - ශ්‍රී ලංකා පොත්හල, 89, උසාවිය හන්දිය, කෑගල්ල.
ධර්මවර්ධන පොත්හල, බස් නැවතුම, නො. 01, පහත මාලය, අඟුරුවැල්ල, රුවන්වැල්ල.
ලංකා පොත්හල, 122, කෙළින් වීදිය, වරකාපොල.
A.J.කොමියුනිකේෂන් සහ පොත්හල, 21A, උසාවිය පාර, මාවනැල්ල.
ජයන්ති පොත්හල, 132, කෙලින් වීදිය, මාවනැල්ල.
කල්‍යාණි පොත්හල, නො. 44, මහවීදිය, රුවන්වැල්ල.
ලංකා පොත්හල, 50/10B, අඟුරුවැල්ල පාර, වරකාපොළ.
ගංගා පොත්හල, නො. 121, කොළඹ පාර, වරකාපොළ.

22. රත්නපුර - කරුණාරත්න සහෝදරයෝ, 16, පල්ලිය පාර රත්නපුර.
ජිනසිරි ට්‍රේඩ් සෙන්ටර්, 96, කෙලින් වීදිය, බලන්ගොඩ.
සුමනගිරි ට්‍රේඩ් සෙන්ටර්, කෙලින් වීදිය, ඇඹිලිපිටිය.
සින්කා පොත්මැදුර, බස්නැවතුම්පල, කුරුවිට.
පත්මසිරි සුපර්සිටි, අංක 54, මතුගම පාර, මානාන, කලවාන
කුරුළු පොත්හල හා කොමියුනිකේෂන්, 79/ජී, කෙලින් වීදිය, පැල්මඩුල්ල.
සමනල කොමියුනිකේෂන් සහ පොත්හල, අංක 52, ප්‍රධාන පාර, ඉඩන්ගොඩ, කිරිඇල්ල.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, නො.23/1, සෙනෙවිරත්න ගොඩනැගිල්ල, පළමු මහළ, කොළඹ පාර, රත්නපුර.
සුබසේකර ස්ටෝර්ස්, 168 ඒ, කෙළින් වීදිය, කහවත්ත.
බුද්ධික ඒජන්සීස් (පුද්ගලික) සමාගම, නො. 24, බස්නැවතුම්පල පාර, රත්නපුර.
සිහින පොත්හල, බස් නැවතුම්පළ පාර, කුරුවිට
ප්‍රදීපා පොත්හල, අංක89/බී, කෙලින් වීදිය, ඇහැලියගොඩ.
තේජාන් පොත් මැදුර, අංක 184ඒ, කෙලින් වීදිය, ගොඩකවෙල.

23. කිලිනොච්චි - අරිවුනති පොත්හල, අංක 06, කනකපුරම් පාර, කිලිනොච්චි.

අංක 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07.
2025.05.09